අ.පො.ස. (උ.පෙළ) විභාගය - 2021 (2022)

47 - ඉස්ලාම් ශිෂ්ඨාචාරය

ලකුණු බෙදීයාම

I - පත්‍රය

බහුවරණ ප්‍රශ්න = 50

එක් ප්‍රශ්නයකට ලකුණු 01 කි

ලකුණු 01 × 50 = ලකුණු 50 යි

II - පත්‍රය

I - කොටස

එක් ප්‍රශ්නයකට අනු කොටස් 05 යි

ලකුණු 04 × 05 = ලකුණු 20

ප්‍රශ්න 02 ට පිළිතුරු ලිවිය යුතුය

ලකුණු 20 × 02 = ලකුණු 40

II - කොටස

එක් ප්‍රශ්නයකට අනු කොටස් 02 යි

ලකුණු 10 × 02 = ලකුණු 20

ප්‍රශ්න 03 ට පිළිතුරු ලිවිය යුතුය

ලකුණු 20 × 03 = ලකුණු 60

අවසන් ලකුණු $= 50 + \frac{100}{2}$

$= \underline{\underline{100}}$

Department of Examinations - Sri Lanka

පරීක්ෂකවරුන් සඳහා පොදු උපදෙස්

1. ඔබ භාරගෙන ඇති මෙම රාජකාරිය ශිෂ්‍ය ශිෂ්‍යාවන්ගේ අනාගතය තීරණය කරන කාර්යක් බැවින් ඉතා වගකීමෙන් ඉටු කළ යුත්තකි.

2. මෙම කාර්යයේදී ඔබ ඉතා අවංකව කටයුතු කළ යුතුයැයි විභාග දෙපාර්තමේන්තු බලාපොරොත්තු වේ.

3. මෙම කාර්ය අල්ලා දෙවියන්ට උත්තර දියයුතු කර්තව්‍යයක් බව ඔබ මතක තබා ගැනීම ඔබේ ක්‍රියාකාරකම් අවංකව කරගෙන යාමට අනිවාර්යෙන් උපකාරී වේ.

4. ලකුණු ලබා දීමේ පරිපාටිය

ලකුණු ලබා දීමේ පරිපාටිය පරීක්ෂකවරුන් අතර සංගටතාවයන් ඇති කරන බැවින්, ශිෂ්‍ය ශිෂ්‍යාවන් සාධාරණව ඇගයීමට ලක්කිරීමට, ලකුණු ලබා දීමේ පරිපාටිය සම්පූර්ණයෙන් පිළිපැදීම අත්‍යවශ්‍ය වේ.

5. උපදෙස්

විභාග දෙපාර්තමේන්තුව විසින් ඉදිරිපත් කර ඇති සියලුම උපදෙස් පරීක්ෂකවරුන් විසින් සම්පූර්ණයෙන්ම පිළිපැදීම අත්‍යවශ්‍ය වේ.

6. උත්තර පත්‍ර ඇගයීම

උත්තර පත්‍ර ඇගයීමේ කාර්ය ආරම්භ කිරීමට ප්‍රථම එක් එක් ප්‍රශ්නය සඳහා ශිෂ්‍යන්ගෙන් බලාපොරොත්තු වන උත්තරය කුමක් දැයි ලකුණු ලබාදීමේ පටිපාටිය හොඳින් කියවා පැහැදිලි කරගත යුතුයි. අමතර පැහැදිලි කිරීම් අවශ්‍යවුවහොත් ප්‍රධාන පාලක පරීක්ෂක/ ප්‍රධාන පරීක්ෂකගේ උපදෙස් ලබාගත හැක.

7. ලකුණු ලබාදීමේ පිළිවෙල

01 වන පත්‍රය
මෙම පත්‍රයේ ප්‍රශ්න 50ක් ඇත. එක් ප්‍රශ්නයකට ලකුණු 01 ක් බැගින් ලකුණු 50 ක් හිමි වේ.

02 වන පත්‍රය
මෙම පත්‍රයේ I කොටස, II කොටස යනුවෙන් කොටස් දෙකක් ඇත. I කොටසේ උප කොටස් පහකින් යුතු ප්‍රශ්න තුනක් ඇතුලත්ය. II කොටසේ උප කොටස් දෙකකින් යුතු ප්‍රශ්න පහක් ඇතුලත්ය. අයදුම්කරුවන් I කොටසේ ප්‍රශ්න දෙකකටත් II කොටසේ ප්‍රශ්න තුනකටත් උත්තර සැපයිය යුතුය. එක් ප්‍රශ්නයකට ලකුණු 20 බැගින් හිමි වේ.

ලකුණු ලබාදීමේ පිළිවෙත

I පත්‍රය 50 × 1 = 50
ප්‍රශ්න 50යි.
ලකුණු 01 බැගින්

II පත්‍රය

I කොටස ප්‍රශ්න 02 ක්	2 × 20	=	40
II කොටස ප්‍රශ්න 03 ක්	3 × 20	=	60
	අවසන් ලකුණු	=	$50 + \left(\frac{40+60}{2}\right)$

Department of Examinations - Sri Lanka

උත්තරපත්‍ර ලකුණු කිරීමේ පොදු ශිල්පීය ක්‍රම

උත්තරපත්‍ර ලකුණු කිරීමේ හා ලකුණු ලැයිස්තුවල ලකුණු සටහන් කිරීමේ සම්මත ක්‍රමය අනුගමනය කිරීම අනිවාර්යයෙන් ම කළ යුතුවේ. ඒ සඳහා පහත පරිදි කටයුතු කරන්න.

1. උත්තරපත්‍ර ලකුණු කිරීමට රතුපාට බෝල් පොයින්ට් පෑනක් පාවිච්චි කරන්න.
2. සෑම උත්තරපත්‍රයකම මුල් පිටුවේ සහකාර පරීක්ෂක සංකේත අංකය සටහන් කරන්න. ඉලක්කම් ලිවීමේදී **පැහැදිලි ඉලක්කමෙන්** ලියන්න.
3. ඉලක්කම් ලිවීමේදී වැරදුණු අවස්ථාවක් වේ නම් එය පැහැදිලිව තනි ඉරකින් කපා හැර නැවත ලියා කෙටි අත්සන යොදන්න.
4. එක් එක් ප්‍රශ්නයේ අනු කොටස්වල පිළිතුරු සඳහා හිමි ලකුණු ඒ ඒ කොටස අවසානයේ △ ක් තුළ ලියා දක්වන්න. අවසාන ලකුණු ප්‍රශ්න අංකයත් සමඟ □ ක් තුළ, භාග සංඛ්‍යාවක් ලෙස ඇතුළත් කරන්න. ලකුණු සටහන් කිරීම සඳහා පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා ඇති තීරුව භාවිත කරන්න.

උදාහරණ : ප්‍රශ්න අංක 03

(i) ..... √ △4

(ii) ..... √ △3

(iii) ..... √ △3

03 (i) 4 + (ii) 3 + (iii) 3 = □10

බහුවරණ උත්තරපත්‍ර : (කවුළු පත්‍රය)

1. අ.පො.ස. (උ.පෙළ) හා තොරතුරු තාක්ෂණ විභාගය සඳහා කවුළු පත්‍ර දෙපාර්තමේන්තුව මගින් සකසනු ලැබේ. නිවැරදි වරණ කපා ඉවත් කළ සහතික කරන ලද කවුළුපතක් ඔබ වෙත සපයනු ලැබේ. සහතික කළ කවුළු පත්‍රයක් භාවිත කිරීම පරීක්ෂකගේ වගකීම වේ.
2. අනතුරුව උත්තරපත්‍ර හොඳින් පරීක්ෂා කර බලන්න. කිසියම් ප්‍රශ්නයකට එක් පිළිතුරකට වඩා ලකුණු කර ඇත්නම් හෝ එකම පිළිතුරක්වත් ලකුණු කර නැත්නම් හෝ වරණ කැපී යන පරිදි ඉරක් අඳින්න. ඇතැම් විට අයදුම්කරුවන් විසින් මුලින් ලකුණු කර ඇති පිළිතුරක් මකා වෙනත් පිළිතුරක් ලකුණු කර තිබෙන්නට පුළුවන. එසේ මකන ලද අවස්ථාවකදී පැහැදිලිව මකා නොමැති නම් මකන ලද වරණය මත ද ඉරක් අඳින්න.
3. කවුළු පත්‍රය උත්තරපත්‍රය මත නිවැරදිව තබන්න. නිවැරදි පිළිතුර ✓ ලකුණකින් ද, වැරදි පිළිතුර 0 ලකුණකින් ද වරණ මත ලකුණු කරන්න. නිවැරදි පිළිතුරු සංඛ්‍යාව ඒ ඒ වරණ තීරයට පහළින් ලියා දක්වන්න. අනතුරුව එම සංඛ්‍යා එකතු කර මුළු නිවැරදි පිළිතුරු සංඛ්‍යාව අදාළ කොටුව තුළ ලියන්න.

ව්‍යුහගත රචනා හා රචනා උත්තරපත්‍ර :

1. අයදුම්කරුවන් විසින් උත්තරපත්‍රයේ හිස්ව තබා ඇති පිටු හරහා රේඛාවක් ඇඳ කපා හරින්න. වැරදි හෝ නුසුදුසු පිළිතුරු යටින් ඉරි අඳින්න. ලකුණු දිය හැකි ස්ථානවල හරි ලකුණු යෙදීමෙන් එය පෙන්වන්න.
2. ලකුණු සටහන් කිරීමේදී ඕවර්ලන්ඩ් කඩදාසියේ දකුණු පස තීරය යොදා ගත යුතු වේ.
3. සෑම ප්‍රශ්නයකටම දෙන මුළු ලකුණු උත්තරපත්‍රයේ මුල් පිටුවේ ඇති අදාළ කොටුව තුළ ප්‍රශ්න අංකය ඉදිරියෙන් අංක දෙකකින් ලියා දක්වන්න. ප්‍රශ්න පත්‍රයේ දී ඇති උපදෙස් අනුව ප්‍රශ්න තෝරා ගැනීම කළ යුතුවේ. සියලු ම උත්තර ලකුණු කර ලකුණු මුල් පිටුවේ සටහන් කරන්න. ප්‍රශ්න පත්‍රයේ දී ඇති උපදෙස්වලට පටහැනිව වැඩි ප්‍රශ්න ගණනකට පිළිතුරු ලියා ඇත්නම් අඩු ලකුණු සහිත පිළිතුරු කපා ඉවත් කරන්න.
4. පරීක්ෂාකාරීව මුළු ලකුණු ගණන එකතු කොට මුල් පිටුවේ නියමිත ස්ථානයේ ලියන්න. උත්තරපත්‍රයේ සෑම උත්තරයකටම දී ඇති ලකුණු ගණන උත්තරපත්‍රයේ පිටු පෙරළමින් නැවත එකතු කරන්න. එම ලකුණ ඔබ විසින් මුල් පිටුවේ එකතුව ලෙස සටහන් කර ඇති මුළු ලකුණට සමාන දැයි නැවත පරීක්ෂා කර බලන්න.

Department of Examinations - Sri Lanka

ලකුණු ලැයිස්තු සකස් කිරීම :

සියලු ම විෂයන්හි අවසාන ලකුණු ඇගයීම් මණ්ඩලය තුළදී ගණනය කරනු නොලැබේ. එබැවින් එක් එක් පත්‍රයට අදාළ අවසාන ලකුණු වෙන වෙනම ලකුණු ලැයිස්තුවලට ඇතුළත් කළ යුතු ය. I පත්‍රය සඳහා බහුවරණ පිළිතුරු පත්‍රයක් පමණක් ඇති විට ලකුණු ලැයිස්තුවට ලකුණු ඇතුළත් කිරීමෙන් පසු අකුරෙන් ලියන්න. අනෙකුත් උත්තරපත්‍ර සඳහා විස්තර ලකුණු ඇතුළත් කරන්න.

***

Department of Examinations - Sri Lanka

AL/2021(2022)/47/S-I 0094

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2021(2022)
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2021(2022)
General Certificate of Education (Adv. Level) Examination, 2021(2022)

ඉස්ලාම් ශිෂ්ටාචාරය I
இஸ்லாமிய நாகரிகம் I
Islamic Civilization I

47 S I

පැය දෙකයි
இரண்டு மணித்தியாலம்
Two hours

උපදෙස්:

* **සියලු ම** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
* උත්තර පත්‍රයේ නියමිත ස්ථානයේ ඔබේ **විභාග අංකය** ලියන්න.
* උත්තර පත්‍රයේ පසුපිටේ දී ඇති උපදෙස් ද සැලකිල්ලෙන් කියවා පිළිපදින්න.
* **1** සිට **50** තෙක් එක් එක් ප්‍රශ්නයට දී ඇති (1), (2), (3), (4), (5) යන පිළිතුරුවලින් **නිවැරදි හෝ ඉතාමත් ගැළපෙන හෝ** පිළිතුර තෝරාගෙන, එය **උත්තර පත්‍රයේ පසුපස දැක්වෙන උපදෙස් පරිදි කතිරයක්** (X) **යොදා දක්වන්න.**

1. ඉස්ලාම් නීතියේ 'රබ්බානියියා' යන්නෙහි අර්ථය කුමක් ද?
(1) පූර්ණත්වය (2) දේවත්වය
(3) යුක්තිය හා සාධාරණත්වය (4) යථාර්ථය
(5) පොදු ලක්ෂණයක්

2. අල්-කුර්ආනය සම්පාදනය කිරීමෙහි සම්බන්ධ වූ නබිතුමාගේ සහාබාවරුන් දෙදෙනෙකු සඳහන් වරණය තෝරන්න.
(1) උමර් (රලි) - මුස්අබ් බින් උමෙර් (රලි)
(2) සයිද් බින් සාබිත් (රලි) - මුආද් බින් ජබල් (රලි)
(3) අබූබක්ර් (රලි) - අබ්දුල් රහ්මාන් බින් අව්ෆ් (රලි)
(4) උමර් (රලි) - හුදෛබතුල් යමානි (රලි)
(5) උස්මාන් (රලි) - සඅද්බින් අබි වක්කාස් (රලි)

3. 'ඉබාරතුන්නස්' යනු,
(1) නීතිය හා සම්බන්ධ වූ සම්මතයන් ය.
(2) අල්-කුර්ආන් වදන්වලට නීති අර්ථදැක්වීම් ය.
(3) පැහැදිලි නීතීන් ය.
(4) නීති ප්‍රකාශවලින් ලබාගන්නා විනිශ්චයන් ය.
(5) අල්-කුර්ආන් නීති වදන් පැහැදිලි කරන හදීස් ප්‍රකාශයන් ය.

4. ඉස්ලාම් ශිෂ්ටාචාරයේ මූලධර්මවලින් ප්‍රධාන එකක් වනුයේ,
(1) මුහාසබා යන ස්වයං විමර්ශනයයි.
(2) මුනාජාත් යන දේවත්ව සබඳතාවයයි.
(3) සුහ්ද් යන ශ්‍රමණ ජීවිතයයි.
(4) මඅාද් පිළිබඳ විශ්වාසයයි.
(5) ඉමාරත් ක්‍රියාවයි.

5. පහත අයගෙන් ශ්‍රී ලංකාවේ ඉස්ලාම් හඳුන්වාදීමේ කාර්යයෙහි සම්බන්ධ වූ නබිතුමාගේ සහාබි වන්නේ,
(1) සඅද් බින් අබි වක්කාස් (රලි) වේ.
(2) වහබ් බින් අබි කබ්ෂා (රලි) වේ.
(3) අබ්දුල් රහ්මාන්-බින් අබී බක්ර් (රලි) වේ.
(4) මුආවියා බින් අබී සුෆ්යාන් (රලි) වේ.
(5) ජෑෆර් බින් අබී තාලිබ් (රලි) වේ.

6. දේශ ගවේෂක ඉබන් බතූතා තුමා ශ්‍රී ලංකාවේ සංචාරය කළ ශතවර්ෂය,
(1) 12 වන ශ.ව. (2) 13 වන ශ.ව. (3) 14 වන ශ.ව. (4) 15 වන ශ.ව. (5) 16 වන ශ.ව.

[දෙවැනි පිටුව බලන්න.

7. පහත ප්‍රකාශ කෙරෙහි අවධානය යොමු කරන්න.

A - පරලොවෙහිදී කිසිවෙකුටත් අල්ලාහ් දැකගත නොහැකි ය.

B - අල්ලාහ්ගේ Zසාද් සහ සිෆාත් එකිනෙකට වෙනස් ය.

ඉහත ප්‍රකාශයන් හා සම්බන්ධ වූවන් පිළිවෙළින්,

(1) මුඃතසිලාවරු - මුර්ජිආවරු වේ.
(2) අෂ්-අරියියාවරු - මුර්ජිආවරු වේ.
(3) කාරිජ්වරු - අෂ්-අරියියාවරු වේ.
(4) ෂිආවරු - කාරිජ්වරු වේ.
(5) මුඃතසිලාවරු - අෂ්-අරියියාවරු වේ.

8. 'ශ්‍රී ලංකා යෝනකයින්ගේ ඉතිහාසය පිළිබඳ විමර්ශනයක්' යන ග්‍රන්ථයේ අන්තර්ගතය,

(1) එක් ජන වර්ගයක ඉතිහාසය, ගති පැවතුම් හා සම්ප්‍රදායන්ගෙන් නොව ලේ ඥාතීත්වය තුළින් නිර්ණය කළ හැකි ය.
(2) ශ්‍රී ලංකා මුස්ලිම්වරු දකුණු ඉන්දීය මුස්ලිම්වරුන්ගෙන් පැවත එන්නන් ලෙස ය.
(3) යුරෝපීයයන් ශ්‍රී ලංකාවට පැමිණීමට පෙර මුස්ලිම්වරු ශ්‍රී ලංකාවේ ස්ථිර ජනාවාස පිහිටුවාගෙන සිටියහ යන්න ය.
(4) ආරම්භයේ සිටම ශ්‍රී ලංකාවේ වෙරළ තීරයේ සහ අභ්‍යන්තරයේ ජීවත් වෙමින් සිටියහ යන්න ය.
(5) මහනුවර රාජ්‍ය තුළ මුස්ලිම්වරු නොයෙක් දෙපාර්තමේන්තුවල සේවකයන් ලෙසත් අධීක්ෂකයන් ලෙසත් සේවයෙහි යෙදුනහ යන්න ය.

9. 'ධර්මයෙහි බලකිරීමක් නැත' යන අල්-කුර්ආන් වදන හඟවන අර්ථය,

(1) ආගමික කටයුතුවල එකඟතාවන්ට පැමිණිය හැකි තත්ත්වයක් පවතී.
(2) මිනිසුන් සියලුදෙනාම නීතිය ඉදිරියේ සමානව සැලකිය යුතු ය.
(3) කිසිවෙකුට තමා අනුගමනය කරන ප්‍රතිපත්ති තව කෙනෙකුට බලකිරීමට නොහැකි ය.
(4) ආගම්, භාෂා, සංස්කෘතීන් ආදිය දිව්‍යමය අධිෂ්ඨානයන් ය.
(5) ආගමික විශ්වාස කැමති ආකාරයට වෙනස් කරගැනීමේ හැකියාව පවතී.

10. 'අර්රයිහානි' යනු,

(1) ප්‍රතිකාර ක්‍රමයකි.
(2) ස්වර්ගයන්ගෙන් එකකි.
(3) සංගීත භාණ්ඩයක නමකි.
(4) අරාබි අක්ෂර කලාවකි.
(5) කාව්‍ය ක්‍රමයකි.

11. නබි මුහම්මද් (සල්) තුමා මදීනාවට පැමිණි විට ප්‍රමුඛතාවය දුන් ක්‍රියා තුනක් පිළිවෙළින්,

(1) මුස්ලිම්වරුන්ගේ ආරක්ෂාව, යුද්ධයට සූදානම් වීම, දෑවා ප්‍රසාරණය ආදිය වේ.
(2) මස්ජිද් ඉදිකිරීම, සහෝදරත්වය ඇති කිරීම සහ මදීනා ශාසනය වේ.
(3) මස්ජිද් ඉදිකිරීම, ළමා අධ්‍යාපනය, අසල්වැසි රටවල් හා සබඳතාවය වේ.
(4) දෑවා ප්‍රසාරණය, වහලුන් නිදහස් කිරීම, යුද්ධයට සූදානම් වීම වේ.
(5) සහෝදරත්වය ඇති කිරීම, ආර්ථික අභිවෘද්ධිය, මදීනා ශාසනය ආදිය වේ.

12. ඉස්ලාම් ශිෂ්ටාචාරයෙහි විශේෂ ලක්ෂණ ලෙස පිහිටනුයේ,

(1) මුස්ලිම් බහුතරය වූ සමාජය පමණක් ඉලක්ක කරගැනීම වේ.
(2) ආධ්‍යාත්මික කරුණුවලට පමණක් අවධාරණය යොමුකිරීම වේ.
(3) තදබල නීතිමය නියමයන්ගෙන් සීමා කරන ලද්දක් වේ.
(4) ලෞකික කරුණුවලට අවධානය යොමු කිරීම වේ.
(5) ජීවිතයට මගපෙන්වීම සඳහා වහි සහ තර්කාන්විතභාවය ආධාරකොට ගෙන තිබීම වේ.

13. අල්-කුර්ආන් වදන් එකලස් කිරීමේ අවශ්‍යතාවය අවධාරණය කරනු ලබන ආකාරයට උමර් (රලි) තුමා ඉදිරිපත් කළ සාධාරණීකරණය,

(1) අල්-කුර්ආනයට සහ මුස්ලිම්වරුන් අතර බැඳීම බිඳී යා හැකිය යන භීතිය.
(2) වැඩිමල් සහාබ්වරුන් ඉදිරියේ අල්-කුර්ආන් සම්පාදනයට යෝග්‍ය වේය යන මතය.
(3) සහාබ්වරුන් අතර පුද්ගලිකව තිබූ අල්-කුර්ආන් වදන්වල ලේඛන පිටපත් විනාශ වී යා හැකිය යන බිය.
(4) අල්-කුර්ආන් කටපාඩම් කර සිටි හාෆිල්වරු ගැටුම්වලදී මියගොස් තිබීම.
(5) සයිද් බින් සාබිත් (රලි) තුමා ජීවතුන් අතර සිටියදී අල් කුර්ආනය එකලස් කිරීම යෝග්‍ය වේය යන පිළිගැනීම.

[තුන්වැනි පිටුව බලන්න.

Department of Examinations - Sri Lanka

14. පහත සඳහන් ප්‍රකාශවලින් වහි හා සම්බන්ධ වූ නිවැරදි ප්‍රකාශය කුමක් ද?
(1) හදීස් කුද්සි ද 'වහියුන් මත්ලුව්වුන්' යන පාරායනය කරන ලද වහියට අයත් වේ.
(2) නබිවරුනට සහ රසුල්වරුනට පමණක් අල්ලාහ් වහි පහළ කළේ ය.
(3) අල්ලාහ් වහි පහළ කරන විට එයට සාක්ෂි ලෙස මලක්වරුන් පත් කළේ ය.
(4) මුජ්තහිද්වරුන්ටත් වහි මගින් මගපෙන්වීම් ලබාදී ඇත.
(5) අල්ලාහ් අධ්‍යාත්මික බලය සහිත පුද්ගලයින්ට වහි පහළ කළේ ය.

15. ඉස්ලාමික චින්තනය ආරක්ෂා කිරීම යන විෂයෙහිදී ඉමාම් සිර්හින්ද් (රහ්) තුමාගේ විරෝධතාවයට ලක් වූ පාලකයා,
(1) අක්බර් රජු (2) කලීෆා මුතවක්කිල්
(3) හුමායුන් රජු (4) කලීෆා හිෂාම්
(5) සාහ්ජහාන් රජු

16. "ලෝකය සූර්යයා වටේ කැරකේ" යන මතය පළමුව ඉදිරිපත් කළ මුස්ලිම් විද්වතා,
(1) ඉබ්රාහීම් අල්-බසාරි වේ. (2) අබු මහ්ෂර් වේ.
(3) අබු සරීද් අස්-සන්ජරි වේ. (4) මුහම්මද් අල්-බීරූනි වේ.
(5) අහමද් අල්-ෆර්කාන් වේ.

17. මදීනා හිජ්රාවට ප්‍රධාන අරමුණ ලෙස පිහිටි සාධකය,
(1) ඉස්ලාමයේ පණිවිඩය ප්‍රචාරණය.
(2) කුරෙෂ්වරුන්ගේ හිරිහැරවලින් මුදවාගැනීම.
(3) කුරෙෂ්වරුන්ගේ විරුද්ධාවාදී ක්‍රියා පැරදවීම.
(4) මුස්ලිම්වරුන්ගේ ආර්ථිකය වැඩිදියුණු කිරීම.
(5) ඥාතීන් හමුවීම වේ.

18. 'අස්මාඋර්-රිජාල්' යනු,
(1) මුස්ලිම් භූගෝල විද්‍යාඥයින්ගේ ජීවන ඉතිහාසයයි.
(2) හදීස් දැනුම්දෙන්නන්ගේ ජීවන ඉතිහාසයයි.
(3) මුස්ලිම් පාලකයන්ගේ ජීවන ඉතිහාසයයි.
(4) අරාබි අක්ෂර විද්‍යාඥයන්ගේ ජීවන ඉතිහාසයයි.
(5) ඉස්ලාමික නීති ක්ෂේත්‍රයේ විද්වතුන්ගේ ජීවන ඉතිහාසයයි.

19. 'උම්මතන් වසතන්' යනු,
(1) උතුම් ප්‍රජාව වේ. (2) මධ්‍යස්ථ ප්‍රජාව වේ.
(3) සංවර්ධිත ප්‍රජාව වේ. (4) ආදර්ශමත් ප්‍රජාව වේ.
(5) උගත් ප්‍රජාව වේ.

20. 'මස්ලහා' පදනමින් ලබාගත් විනිශ්චයකට හොඳ උදාහරණයකි.
(1) මත්ද්‍රව්‍ය හරාම් වේ යන විනිශ්චය.
(2) ස්ත්‍රීන්ට රත්‍රන් හලාල් වේ යන විනිශ්චය.
(3) මත්පැන් භාවිතයට කස පහරදීම යන විනිශ්චය.
(4) ආෂූරා දිනයේ උපවාස කිරීම.
(5) සිරගෙවල් පිහිටුවීම.

21. පහත ප්‍රකාශ අතුරෙන් තජ්දීද් සම්බන්ධ වූ වඩාත් නිවැරදි ප්‍රකාශ තෝරන්න.
A - මුජද්දිද් යන්නන් තමාව තමාම මුජද්දිද් ලෙස ප්‍රකාශයට පත් කරගන්නා අය වේ.
B - ඉමාම් හසනුල් බශරි (රහ්) තුමා ආරම්භක සමයේ මුජද්දිද් අතරින් කෙනෙකි.
C - මිනිස් යහපත පදනම් කරගෙන, ඉස්ලාම්හි සියලුම අංශවල තජ්දීද් පැවතිය හැකි ය.
D - මුජද්දිද්වරු සියලු ක්ෂේත්‍රයන්හි පාණ්ඩිත්‍ය ලබා තිබීම අනිවාර්ය නොවේ.
(1) A, B (2) A, D (3) A, C (4) B, D (5) B, C

22. කෙනෙක් තම භාර්යාව සමග ඇයගේ මවගේ සහෝදරිය හා විවාහවීම තහනම් කර ඇත යන්න සඳහන් වන නීති මූලාශ්‍රය කුමක් ද?
(1) අල්-කුර්ආන් (2) අල්-හදීස් (3) අල්-ඉජ්මා
(4) අල්-උර්ෆ (5) මස්ලහා මුර්සලා

[හතරවැනි පිටුව බලන්න.

Department of Examinations - Sri Lanka

23. මාප්පිලෙයි ලෙබ්බේ ආලිම්තුමා ස්ථාපිත කළ අරාබි විද්‍යාලයක් සහ ඔහු විසින් රචනා කරන ලද ග්‍රන්ථයකුත් පෙන්වන වරණය කුමක් ද?
(1) මද්රසතුල් බාරි - තුහ්බතුන් නහ්වු
(2) මද්රසතුල් මක්කියා - ෆත්හුද්දයාන්
(3) මද්රසතුල් හිල්රියියා - මවාකීදුස්සලාත්
(4) මද්රසතුල් බාරි - ෆත්හුද්දයාන්
(5) මද්රසතුල් මක්කියා - ෂුරූතුස්සලාත්

24. පහත දැක්වෙන්නේ හදීස් හා සම්බන්ධ වූ ඇතැම් කරුණු වේ.
A - ඉස්නාද්හි බිඳීමක් සිදු වී තිබීම
B - රාවිවරුන්ගේ අඩුපාඩු පැවතීම
C - අඩු සංඛ්‍යාවක් වූ රාවිවරු විසින් දැනුම් දී තිබීම
D - සහීහ් වූ හදීස්වලට පටහැනිව තිබීම
E - නබිතුමාගේ වෆාතයට ආසන්න සමයේ රිවායත් කර තිබීම
ඉහත සඳහන් කරුණු අතුරින් හදීසයක් ප්‍රතික්ෂේප කිරීමට හේතු වූ කරුණු දැක්වෙන වරණය තෝරන්න.
(1) A, B, C (2) A, B, D (3) A, C, D (4) B, C, D (5) B, D, E

25. මුස්ලිම් යුධ සෙබළුන් භාවිත කළ 'කව්සා' යන ආයුධය,
(1) මංජනික් උපකරණය වේ. (2) ඊතලය වේ.
(3) යකඩෙන් නිම වූ හිස් ආවරණය වේ. (4) සන්නද්ධ රථය වේ.
(5) කුඩාරම වේ.

26. ජාහිලියා කාව්‍ය සංග්‍රහයන් සමහරක් 'මුඅල්ලකාත්' ලෙස හැඳින්වීමට හේතුව,
(1) ඒවා කඃබාහි එල්ලා තිබීම.
(2) ඒවා රන් අක්ෂරවලින් නිර්මාණය කර තිබීම.
(3) ඒවා ප්‍රසිද්ධියට පත්ව තිබීම.
(4) ඒවා තරඟවලින් ජයග්‍රහණය කර තිබීම.
(5) ඒවායෙහි ආදරය, වීරත්වය ආදිය ඇතුළත්ව තිබීම.

27. මහනුවර රාජධානියේ 'ඔට්ටුපන්තිය' යන දෙපාර්තමේන්තුවට දී තිබූ වගකීම,
(1) ප්‍රවාහනය (2) වෛද්‍ය අධීක්ෂණය
(3) රාජකීය මුළුතැන්ගෙය (4) ධීවර අංශය
(5) ආරක්ෂාව

28. මිනිසා අල්ලාහ්ගේ නියෝජිතයෙක්ය යන්න හඟවන අරාබි වචනය
(1) හුජ්ජතුල්ලාහ් (2) රසූලුල්ලාහ් (3) කලීෆතුල්ලාහ්
(4) කරාමතුල්ලාහ් (5) වලියුල්ලාහ්

29. "ඉස්ලාමික නීති ක්ෂේත්‍රයේ අරමුණු" අන්තර්ගතවන කොටස් තුන පිළිවෙළින්,
(1) උලූහියියා, වාසිලියියා, උමූමියියා
(2) ළරූරියියා, රබ්බානියියා, හාජියියා
(3) අසබියියා, කව්මියියා, හාපිමියියා
(4) හාජියියා, ෂුමූලියියා, වාකිඉයියා
(5) ළරූරියියා, හාජියියා, තහ්සීනියියා

● **30** සිට **33** දක්වා සෑම ප්‍රශ්නයක්ම **X, Y** තීරු යටතේ තොරතුරු දී ඇත. **Y** තීරුවේ ඇති දේ **X** තීරුවේ ඇති දේ සමග කිසියම් හෝ ආකාරයකින් සම්බන්ධ වී ඇත. එහෙත් ඒවා අපිළිවෙළින් පවතියි. **X** තීරුවේ ඇති පිළිතුරට ගැළපෙන පරිදි **Y** තීරුවේ ඇති තොරතුරු ගළපා පිළිවෙළට සකස් කොට නිවැරදි ගැළපුම තෝරන්න.

30.

X	Y
1. නෛසාපූර්	A - මුහම්මද් ඉල්යාස්
2. කූෆා	B - ඉබ්නු රුෂ්ද්
3. කුර්තුබා	C - ඉමාම් මුස්ලිම්
4. කාන්තලා	D - ඉමාම් අබූහනීෆා

(1) A, C, B, A (2) B, D, A, C (3) C, D, B, A (4) C, B, D, A (5) D, A, C, B

[පස්වැනි පිටුව බලන්න.

Department of Examinations - Sri Lanka

31.

X	Y
1. ශ්‍රී වික්‍රම රාජසිංහ	A - කපිතාන් තාගූර්
2. පළමු බුවනෙකබාහු	B - විනිසුරු රාජකරුණ ගෝපාල
3. කීර්ති ශ්‍රී රාජසිංහ	C - තානාපති අබු උස්මාන්
4. බුවනෙකබාහු	D - මඩිගේ නිලමේ මොලා

(1) A, B, C, D (2) B, C, D, A (3) B, A, D, C (4) A, D, C, B (5) B, A, D, C

32.

X	Y
1. අබු හනීෆා දීනාවාරි	A - තාරකා විද්‍යාව
2. කුවාරිස්මි	B - උද්භිත විද්‍යාව
3. අබු උබෛදා	C - සත්ත්ව විද්‍යාව
4. අල්-ෆතානි	D - වෛද්‍ය විද්‍යාව
5. ඉබ්නු සීනා	E - ගණිතය

(1) A, E, C, B, D (2) B, E, C, A, D (3) A, C, B, D, E
(4) B, A, D, C, E (5) C, A, D, E, B

33.

X	Y
1. උමර් (රලි)	A - අමානුල් උම්මත් (සමාජ ආරක්ෂකයා)
2. අස්හාබුස් සුෆ්ෆා	B - නබිතුමා යෙමන් දේශයට යැවූ තානාපති
3. සයිද් බින් සාබිත් (රලි)	C - මජ්ලිසුස්-ෂූරා බිහි කිරීම
4. මුආද් බින් ජබල් (රලි)	D - අධ්‍යාපනයේ දියුණුව සඳහා කැපවීම
5. අබු උබෛදා අල් ජර්රාහ් (රලි)	E - හීබෘ භාෂාවේ පරිචය ලැබුවෙකි

(1) A, E, B, D, C (2) B, C, A, E, D (3) C, D, E, B, A
(4) D, A, B, C, E (5) E, C, A, D, B

34. අබුබක්ර් (රලි) තුමා විසින් සම්පාදිත "මුස්හෆ්", උස්මාන් (රලි) විසින් භාරගන්නා තෙක් ආරක්ෂා කර තැබූ සහාබි මාතාව,
(1) උම්මු සල්මා (රලි) (2) ෆාතිමා (රලි)
(3) අයිෂා (රලි) (4) හෆ්සා (රලි)
(5) සෛනබ් (රලි)

35. "පිරිමින් ඉපයූ දේ පිරිමින්ට අයත් ය. ස්ත්‍රීන් ඉපයූ දේ ස්ත්‍රීන්ට අයත්ය" යනු,
(1) අල්-කුර්ආනයේ ප්‍රකාශයකි. (2) නබිතුමාගේ ප්‍රකාශයකි.
(3) ඉජ්මාඃ වූ විනිශ්චයකි. (4) උම්මහාතුල් මුඃමිනීන්වරුන්ගේ අදහසකි.
(5) කාරිජ්වරුගේ මතය වේ.

36. පහත සඳහන් ග්‍රන්ථ අතුරෙන් සංගීත කලාව හා සම්බන්ධව ලියූ ග්‍රන්ථය
(1) අල් මුස්තඃමල් (2) ඉක්දුල් ෆරීද්
(3) කිතාබ් අල් මික්යාස් (4) සූරතුල් අර්ල්
(5) තාරීකුල් කබීර්

37. ඉස්නාද්හි දැනුම්දෙන්නන්ගේ සංඛ්‍යාව මත පදනම්ව සැකසෙන හදීස් වර්ග පමණක් ඇතුළත් වරණය තෝරන්න.
(1) අල්-මුඅල්ලක්, අල්-මුර්සල්, අල්-ගරීබ් (2) අල්-මුර්සල්, අල්-හසන්, අල්-අසීස්
(3) අල්-මව්කූෆ්, අල් මෂ්හූර්, අල් මක්බූල් (4) අල්-මෂ්හූර්, අල් සහීහ්, අල් ළඊෆ්
(5) අල්-මෂ්හූර්, අල් අසීස්, අල්-ගරීබ්

38. අබ්දුල්ලාහ් බින් උරෛකත් නමැත්තා මුස්ලිම් නොවුනත් මුහම්මද් නබි (සල්) තුමාට සහය දුන් සිද්ධිය,
(1) හිල්ෆුල් ෆුලූල් සම්මුතියයි. (2) මදීනා හිජ්රතය වේ.
(3) අබිසීනියානු හිජ්රතය වේ. (4) හුනෛන් යුද්ධය වේ.
(5) හුදෛබියා සම්මුතිය වේ.

[හයවැනි පිටුව බලන්න.

Department of Examinations - Sri Lanka

39. පහත සඳහන් ප්‍රකාශ අතුරෙන් වඩාත් නිවැරදි ප්‍රකාශය තෝරන්න.
(1) වසර දහයක යුධ නැවැත්වීම යනු මදීනා ගිවිසුමෙහි කොන්දේසිවලින් එකකි.
(2) ලව්හුල් මෆූල් → බෛතුල් ඉස්සා → ජිබ්රීල් (අලෛ) → මුහම්මද් (සල්) යන පිළිවෙළට අල්-කුර්ආන් වදන් පහළ කර ඇත.
(3) නබිවරුන්ගේ පැමිණීම අවසන් වී ඇති ආකාරයට මුජද්දිද්වරුන්ගේ පැමිණීමත් අවසන් වී ඇත.
(4) අහ්ලුත් තව්හීද් වල්-අද්ල් යන අය මද්හබ් අනුගමනය කරන්නන් වේ.
(5) උමයියා බින් හල්ෆ් මක්කාහි පිළිම වන්දනාව හඳුන්වා දෙන ලදී.

40. 'ක්‍රියාවන් සියල්ල අපේක්ෂාවන් මත පදනම් වේ' යන ඉස්ලාමීය නීති ආප්තෝපදේශය දක්වන අරාබි වාග් ශෛලය
(1) අල් - යකීනු ලා යසුලු බිෂ්ෂක්
(2) අල් - උමූරු බිමකාසිදිහා
(3) අල් - ළරූරාත් තුබීහුල් මහ්ලූරාත්
(4) අල් - ළරරු යුදාලු
(5) අල් - ආදතු මුහ්කමතුන්

41. පහත සිද්ධීන් කෙරෙහි අවධානය යොමු කරන්න.
A - දූමතුල් ජන්දල් සිද්ධිය
B - අබ්දුල්ලා බින් සබාගේ කුමන්ත්‍රණය
C - අලි (රලි) සහ අයිෂා (රලි) අතර වූ විරුද්ධවාදිකම්
D - කාරිජ්වරුන්ගේ බිහිවීම
E - උස්මාන් (රලි) තුමාගේ ඝාතනය
ඉහත සිද්ධීන්හි නිවැරදි අනුපිළිවෙළ කුමක් ද?
(1) A, B, C, D, E (2) B, E, C, D, A (3) C, E, A, D, B
(4) B, E, C, A , D (5) B, C, E, A, D

42. පහත සඳහන් සටහන් අතුරෙන් තව්වාබීන් පිළිබඳ වඩාත් නිවැරදි සටහන කුමක් ද?
(1) හුසෛයින් (රලි) තුමාව අත්හැරියෙමු යැයි කනස්සල්ලට පත්වූවන් වේ.
(2) හජ්ජාජ් බින් යුසූෆ්ගේ ආධාරකරුවන් වේ.
(3) අබ්දුල් මලික් බින් මර්වාගේ හමුදා සෙබලුන් වේ.
(4) අබ්බාසි කිලාෆතය බිහිකිරීමට ප්‍රබල ලෙස යෙදී සිටි අය වේ.
(5) අලි (රලි) - පාතිමා (රලි) පරම්පරාවේ පවුල් සමාජිකයන් වේ.

43. සහීහුල් බුහාරි යන හදීස් ග්‍රන්ථයේ ව්‍යාඛ්‍යානයක් දැක්වෙන කොටස
(1) නෙලුල් අව්තාර් - ඉර්ෂාදුෂ්ෂාරි
(2) අල්-මූනි - ෆුතූහුල් ගෛබ්
(3) ඉර්ෂාතුෂ්ෂාරි - ෆත්හුල් බාරි
(4) ෆත්හුල් බාරි - ෂරහුල් වරකත්
(5) දාදුල් මආද් - අල් උම්මු

44. පහත ප්‍රකාශයන්ගෙන් නිවැරදි ප්‍රකාශය තෝරන්න.
(1) තෆ්සීර්, තෑවිල් යන පද යුගලය අල්-කුර්ආන් විවරණය හා සම්බන්ධ වේ.
(2) ඉජ්තිහාද් කාලය අනුව සීමා කරන ලද කරුණකි. එය සියලුම කාලයන්ට අයත් නොවේ.
(3) මිනිසා තම බුද්ධිය භාවිත කොට ජීවිතයට අවශ්‍ය පදනම හා සංකල්පයන් සකසාගත යුතුය යන්න ඉස්ලාමික මග පෙන්වීම වේ.
(4) මහ්දියා සහ රෆීකා යන නගර කලීෆා හාරූන් රෂීද් තුමා නිර්මාණය කළේය.
(5) මදීනා නගරයට සතුරන් විසින් පහර දෙන විටදී එය ආරක්ෂා කිරීමේ සම්පූර්ණ බලය මුස්ලිම්වරු සතුව තිබේ යන්න මදීනා සම්මුතියේ කොන්දේසියකි.

45. නිවැරදි ප්‍රකාශය තෝරන්න.
(1) අල්-සිකායා, අල් හිජාබා යනු ජාහිලියා සමයේ දක්නට තිබූ විවාහ ක්‍රම දෙකකි.
(2) අස්මා උර්රිජාල් සහ ඉල්මුල් ජරහ් වත්තඅදීල් යන ඉස්ලාමික නීති ක්ෂේත්‍රය හා සම්බන්ධ වූ වචන දෙකකි.
(3) මස්ජිදුල් කුර්තුබා සහ අල්-හම්රා යනු ස්පාඤ්ඤයේ පිහිටා ඇති ගොඩනැගිලි වේ.
(4) ඉමාම් බුහාරි සහ ඉමාම් තිර්මිදි යන දෙදෙනා හදීස් සංග්‍රහයන් 'සහීහෙන්' ලෙස හඳුන්වති.
(5) බුවෛහිද් සහ සෙල්ජූක් උමෛයා සමයේ කුඩා රාජ්‍යයන් වේ.

[හත්වැනි පිටුව බලන්න.

Department of Examinations - Sri Lanka

- අංක **46** සිට **50** දක්වා ප්‍රශ්නවලට අදාළ ව ප්‍රකාශ දෙක බැගින් දී ඇත. එක් එක් ප්‍රශ්න අංකයට අදාළ ව දී ඇති ප්‍රකාශ යුගලය සම්බන්ධයෙන් පහත සඳහන් (1), (2), (3), (4), (5) යන වරණවලින් වඩාත් ගැළපෙන යුගලය සහිත වරණය තෝරා එහි අංකය පිළිතුරු පත්‍රයේ සලකුණු කරන්න.

අංකය	පළමු ප්‍රකාශය	දෙවන ප්‍රකාශය
(1)	නිවැරදි ය.	නිවැරදි ය.
(2)	වැරදි ය.	නිවැරදි ය.
(3)	නිවැරදි ය.	වැරදි ය.
(4)	වැරදි ය.	වැරදි ය.
(5)	නිවැරදි ය.	නිවැරදි වන අතර පළමු ප්‍රකාශය තවදුරටත් විග්‍රහ කෙරේ.

	පළමු ප්‍රකාශය	දෙවන ප්‍රකාශය
46.	කලීෆා මාමුන්ගේ සමයේ රටේ දියුණුවට මහඟු සේවාවක් සිදුකළේ බර්මිකිවරුන් විසින් ය.	රිසාලත් දැනුමේ මූලාශ්‍රයකි. දෘෂ්ටිය හා තර්කාන්විතභාවය මගින් දැනගැනීමට නොහැකි දේ දැනගැනීමට එය උපකාරී වේ.
47.	මුස්ලිම්වරුන් අතර ආගමික චින්තන කණ්ඩායම්වල බිහිවීමට තාර්කික චින්තනයන් කාරණයක් විය.	මොලූආත් වූ හදීස් දොස් තැබීමට මිස ප්‍රතික්ෂේප කිරීමට අවශ්‍ය නොවේ.
48.	ඉස්ලාමික දෘවා ඉතිහාසයේ කුරෙෂිවරුන්ගේ ශාරීරික හිංසාවලට ලක්නොවූ කෙනෙකි අබුබක්ර් (රලි) තුමා	ඉස්ලාම් අධිරාජ්‍යයන්ගේ ප්‍රසාරණයේදී අබ්බාසි කලීෆාවරුන්ගේ භූමිකාවට වඩා උමෙයා කලීෆාවරුන්ගේ භූමිකාව ප්‍රධාන විය.
49.	අරාබි අර්ධද්වීපයට බාහිරව නබිතුමාගේ දෘවා, හුදෛබියා සම්මුතිය තිබූ කාලයේ ප්‍රබල විය.	සල්මාන් අල්-ෆාරිස් (රලි) නබි මුහම්මද් (සල්) තුමාගේ කිරිමව වූ හලීමාගේ පුතණුවන්ගෙන් කෙනෙකි.
50.	ඩමස්කස් කෛසුන් කන්දේ නිර්මාණය කොට ඇති කාලගුණ මධ්‍යස්ථානයේ 'අර්-රස්ම් අල්-මයිමූනි' ලෙස හැඳින්වේ.	රවුම් හැඩයෙන් හා තිත්වලින් ජීව සංකේතවලින් යුත් පහසුවෙන් කියවිය හැකි අරාබි වචන 'අස් සුලුස්' ලෙස හැඳින්වේ.

* * *

Department of Examinations - Sri Lanka

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்

අ.පො.ස. (උ.පෙළ) විභාගය / க.பொ.த. (உயர் தர)ப் பரீட்சை - 2021 (2022)

විෂය අංකය / பாட இலக்கம் **47**

විෂයය / பாடம் **ඉස්ලාම් ශිෂ්ටාචාරය**

ලකුණු දීමේ පටිපාටිය / புள்ளி வழங்கும் திட்டம்

I පත්‍රය / பத்திரம் I

ප්‍රශ්න අංකය / வினா இல.	පිළිතුරු අංකය / விடை இல.	ප්‍රශ්න අංකය / வினா இல.	පිළිතුරු අංකය / விடை இல.	ප්‍රශ්න අංකය / வினா இல.	පිළිතුරු අංකය / விடை இல.	ප්‍රශ්න අංකය / வினா இல.	පිළිතුරු අංකය / விடை இல.	ප්‍රශ්න අංකය / வினா இல.	පිළිතුරු අංකය / விடை இல.
01.	2	11.	2	21.	4	31.	2	41.	4
02.	4	12.	5	22.	2	32.	2	42.	1
03.	3	13.	4	23.	4	33.	3	43.	3
04.	4	14.	2	24.	2	34.	4	44.	1
05.	2	15.	1	25.	3	35.	1	45.	3
06.	3	16.	3	26.	1	36.	2	46.	2
07.	5	17.	1	27.	5	37.	5	47.	3
08.	1	18.	2	28.	3	38.	2	48.	2
09.	3	19.	2	29.	5	39.	2	49.	3
10.	4	20.	5	30.	3	40.	2	50.	3

✪ **විශේෂ උපදෙස් / விசேட அறிவுறுத்தல் :**

එක් පිළිතුරකට / ஒரு சரியான விடைக்கு ලකුණු 01 බැගින் / புள்ளி வீதம்

මුළු ලකුණු / மொத்தப் புள்ளிகள் 1 × 50 = 50

Department of Examinations - Sri Lanka

AL/2021(2022)/47/S-II

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2021(2022)
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2021(2022)
General Certificate of Education (Adv. Level) Examination, 2021(2022)

ඉස්ලාම් ශිෂ්ටාචාරය II
இஸ்லாமிய நாகரிகம் II
Islamic Civilization II

47 S II

පැය තුනයි
மூன்று மணித்தியாலம்
Three hours

අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි
மேலதிக வாசிப்பு நேரம் - 10 நிமிடங்கள்
Additional Reading Time - 10 minutes

අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේදී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.

උපදෙස්:

※ I කොටසින් ප්‍රශ්න **දෙකක්** ද, II කොටසින් ප්‍රශ්න **තුනක්** ද තෝරාගෙන, ප්‍රශ්න **පහකට** පිළිතුරු සපයන්න.

I කොටස

1. (i) 'ඉජ්තිහාද්' යන්න අර්ථ දක්වන්න.

(ii) කෙටි හැඳින්වීමක් සහිතව මසාදිර් අක්ලියියාවට උදාහරණ **දෙකක්** දෙන්න.

(iii) ඉජ්තිහාද් අනුමත කර ඇත යන්න සඳහන්වන අල්-කුර්ආන්, අල්-හදීස් මූලයක් බැගින් දෙන්න.

(iv) ඉජ්තිහාද් ඉන්තිකාඊ, ඉජ්තිහාද් ඉන්ෂාඊ ගැන පැහැදිලි කරන්න.

(v) 'අල් මෂක්කතු තජ්ලිබුත් තෛසීර්' යන නීති ප්‍රකාශයේ අර්ථය පැහැදිලි කරන්න.

(ලකුණු 04 × 5 = 20 යි)

2. (i) වහිවල අවශ්‍යතාවය පෙන්වාදෙන සාධාරණ හේතු **දෙකක්** දෙන්න.

(ii) අල්-කුර්ආන් එක් වතාවකින් පහළ නොකිරීමට හේතු **හතරක්** සඳහන් කරන්න.

(iii) තර්තීබුත්-තිලාවත්, තර්තීබුන්-නුසුල් යන **දෙක** වෙන් කර දක්වන්න.

(iv) හදීස් නීති මූලාශ්‍රයක්ය යන්න පෙන්වන අල්-කුර්ආන්, අල්-හදීස් මූලයක් බැගින් සඳහන් කරන්න.

(v) ඉස්ලාම් නීති සම්පාදනයේදී අල්-කුර්ආන් අනුගමනය කර ඇති **පියවරක්** නිදසුන් සහිතව පැහැදිලි කරන්න.

(ලකුණු 04 × 5 = 20 යි)

3. (i) කිලාෆත් සහ මුල්කියියත් යන වාක්‍ය ඛණ්ඩ පැහැදිලි කරන්න.

(ii) උමෙයාවරු පාලනය ලබාගැනීමට හේතු වූ කරුණු **දෙකක්** සඳහන් කරන්න.

(iii) කලීෆා වලීද් සමයේ සිදු වූ ස්පාඤ්ඤ ජයග්‍රහණය ගැන සංක්ෂිප්තව සඳහන් කරන්න.

(iv) අබ්බාසි සමයේ නගර හා බලකොටු ඉදිකිරීම් ගැන උදාහරණ **දෙක** බැගින් දෙන්න.

(v) අබ්බාසි කිලාෆතයේ බලය බිඳීයාමට හේතු වූ කරුණු **හතරක්** පැහැදිලි කරන්න.

(ලකුණු 04 × 5 = 20 යි)

[දෙවැනි පිටුව බලන්න.

Department of Examinations - Sri Lanka

II කොටස

4. (i) භූගෝල විද්‍යා ක්ෂේත්‍රයේ වර්ධනයට දායක වූ මුස්ලිම් විද්වතුන් **දෙදෙනෙකුගේ** සේවාවන් අගය කරන්න.

(ii) උමෙයා සහ අබ්බාසි සමයන්හි මුස්ලිම්වරුන්ගේ භාෂා පරිවර්තන ක්ෂේත්‍රයේ දායකත්වය ගැන විස්තර කරන්න.

(ලකුණු 10 × 2 = 20 යි)

5. (i) ගොතන ලද හදීස් බිහිවීමට හේතු වූ කරුණු පෙන්වා දෙන්න.

(ii) හදීස් කලාවේ වර්ධනයට ඉමාම් බුහාරි (රහ්) සහ මුස්ලිම් (රහ්) ගේ දායකත්වය සංසන්දනය කරන්න.

(ලකුණු 10 × 2 = 20 යි)

6. (i) තෆ්සීර් කලාවේ වර්ධනයට තාබිඊන් සමයේ භූමිකාව විස්තර කරන්න.

(ii) මුඃතසිලාවරුන්ගේ ප්‍රධාන සංකල්ප **පහම** පැහැදිලි කරන්න.

(ලකුණු 10 × 2 = 20 යි)

7. (i) මුස්ලිම්වරයෙකු තම මැවුම්කරුවා සමග සබඳතා ඇති කරගැනීමේ ඇති ප්‍රයෝජන පැහැදිලි කරන්න.

(ii) අනෙකුත් සමාජයන් හා එක්ව ජීවත්වීම සම්බන්ධ ඉස්ලාමික ඉගැන්වීම් විස්තර කරන්න.

(ලකුණු 10 × 2 = 20 යි)

8. (i) ක්‍රි.ව. 7 වන සහ 8 වන ශතවර්ෂවල ශ්‍රී ලංකාවේ ඉස්ලාම් හඳුන්වාදීම පිළිබඳව සාධක සහිතව පැහැදිලි කරන්න.

(ii) මහනුවර රාජධානියේ මුස්ලිම්වරුන් සිදු කළ සේවාවන්ගේ ලැයිස්තුව ඉදිරිපත් කොට එයින් ක්ෂේත්‍ර **දෙකක්** ගැන පැහැදිලි කරන්න.

(ලකුණු 10 × 2 = 20 යි)

* * *

Department of Examinations - Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස්පෙළ) විභාගය - 2021 (2022)

47 - ඉස්ලාම් ශිෂ්ටාචාරය

ලකුණු දීමේ පටිපාටිය

I කොටස

කොටස - 1

1

(i) ඉජ්තිහාද් යන්න අර්ථ දක්වන්න.

- අල් ඉජ්තිහාද් (الإجتهاد) යන වචනය ඉජ්තිහද (إجتهد) යන ක්‍රියා පදයට ප්‍රතික්‍රියාවකි. ඉජ්තිහාද් ව්‍යුත්පන්න වී ඇත්තේ අල් ජුහ්ද් (الجُهْدُ) යන වචනයෙනි. උත්සාහය, වෙහෙස වී වැඩ කිරීම, මහන්සි වී වැඩ කිරීම සහ කැපවීම ඍජු සංකල්පය. භාෂාමය වශයෙන් මෙම යෙදුමෙන් අදහස් කරන්නේ ඕනෑම සංකල්පයක් මත පූර්ණ බලයෙන් වැඩ කිරීමයි.

- ඉස්ලාමීය භාෂාවෙන් ඉජ්තිහාද් යනු **නීතිමය ගැටලුවක් සඳහා පැහැදිලි පැහැදිලි කිරීමක් නොමැති විට ෂරීඅත් හි නීතිමය මූලාශ්‍ර මත පදනම්ව තම චින්තනය භාවිතා කර නිගමනයකට පැමිණීමට ඉස්ලාමීය නීතිවේදීන්ගේ උත්සාහයකි.** මෙම කාර්ය සඳහා සම්බන්ධ වන්නේ මුජ්තහිද්වරුන්ය

(ලකුණු 04)

(ii) කෙටි හැඳින්වීමක් සහිතව මසදීර් අක්ලියාවට උදාහරණ දෙකක් දෙන්න.

- කුරානය, සුන්නාව, (අල් ඉජ්මා) හැර අනෙකුත් ඉස්තිහ්සාන්, කියාස්...වෙනි උප මූලාශ්‍ර දෙකක් පිළිබඳ සඳහන් කර කෙටියෙන් හැඳින්වීමක් කිරීම.

(ලකුණු 04)

(iii) ඉජ්තිහාද් අනුමත කර ඇත සඳහන්වන අල් කුර්ආනය අල්-හදීස් මූලයක් බැගින් දෙන්න.

අල් කුර්ආනය

- අල්ලාහ් ඔබට පෙන්වා දුන් පරිදි මිනිසුන් අතර විනිශ්චය කිරීමට සත්යය ඇති මෙම ශුද්ධ ලියවිල්ල අපි ඔබට තහවුරු කළෙමු. (4:105)
- සාමය හෝ සන්ත්‍රාසය පිළිබඳ කිසියම් පුවතක් ලද විගස ඔවුන් එය ප්‍රචාරය කරති. ඔවුන් එසේ නොකළේ නම්, ඔවුන් එය අල්ලාහ්ගේ දූතයාණන්ට හෝ ඔවුන් අතරින් දහම ගැන දැනුමක් ඇති බලධාරින්ට දැනුම් දෙනු ඇත. (4:83)

Department of Examinations - Sri Lanka

අල්-හදීස්

- විනිසුරුවරයා ඔහුගේ ඉජ්තිහාද් භාවිතා කර දෙන විසඳුම නිවැරදි නම් ප්‍රතිලාභ දෙකම වැරදි නම් වාසියක් ඇත (බුහාරි මුස්ලිම්)
- මුආද් ඉබ්න් ජබාල් (රළියල්ලාහු අන්හු) ඔවුන්ව යේමනයට ආණ්ඩුකාරවරයා ලෙස යවන විට නබිතුමාත් එක්ක පැවැත්වූ සංවාද (කිතාබුල් උම්මු)

(ලකුණු 04)

(iv) ඉජ්තිහාද් ඉන්තිකාරී, ඉජ්තිහාද් ඉන්ෂාරී ගැන පැහැදිලි කරන්න.

- **ඉජ්තිහාද් ඉන්තිකාරී**
  සුදුසුකම්ලත් නීති විශාරදයකු විසින් දෙන ලද විනිශ්චයන් හෝ ගැඹුරු අධ්‍යයනයේ පහරක් ලෙස ඔවුන් විසින් විනිශ්චය කරනු ලබන කරුණු වලින් යහපත් දේ තෝරා ගැනීම

- **ඉජ්තිහාද් ඉන්ෂාරී**
  එයින් අදහස් කරන්නේ සුදුසුකම් ලත් මුජ්තහිද් කෙනෙකු නව ප්‍රශ්නයක් සම්බන්ධයෙන් නව තීන්දුවකට පැමිණීම හෝ මීට පෙර කිසිවකු නොපැමිණි තීන්දුවකට පැමිණීම හෝ පවතින තීන්දුව වෙනුවට නව විසඳුමකට පැමිණීමයි.

(ලකුණු 04)

(v) "අල්මෂක්කතු තජ්ලිබුත් තයිසිර්" යන නීති ප්‍රකාශයේ අර්ථය පැහැදිලි කරන්න.

- දුෂ්කරතා නීති ලිහිල් කරයි
  (ගමනයක සිටින අයට සලාතය කැටි කිරීමටත් එකතු කිරීමටත් තියන අවස්ථාව)
  ඉහත සංකල්පය කෙටියෙන් පැහැදිලි කළ යුතුය

(ලකුණු 04)

2.

(i) වහිවල අවශ්‍යතාවය පෙන්වාදෙන සාධාරණ හේතු දෙකක් දෙන්න.

- වහි පිළිගෙන අනුගමනය කරන ලෙස අල්ලාහ් අපට අණ කර ඇත
- මිනිසාට තාර්කිකව දැනගත නොහැකි කාරණාවලදී මඟ පෙන්වීම අවශ්‍යතාවය
- මිනිස් ජීවිතය සඳහා මග පෙන්වීමේ අවශ්‍යතාවය
- මිනිසාගේ අධ්‍යාත්මික හා සදාචාරාත්මක මූලධර්ම පිළිබඳ මිනිසාගේ දැනුම තනිව පැහැදිලිකරගැනීමට නොහැකි තත්වයක් තුළ වහි මඟ පෙන්වීම අවශ්‍ය වේ

(ලකුණු 04)

Department of Examinations - Sri Lanka

(ii) අල් කුර්ආනය එකත වතාවකින් පහළ නොකිරීමට හේතු හතරක් සඳහන් කරන්න.

1. අල්ලාහ්ගේ කැමැත්ත සහ සැලැස්ම
2. අනුපිළිවෙල
3. නබි තුමාගේ මනස ශක්තිමත් කිරීම
4. ඕනෑම අවස්ථාවක අල්ලාහ් ඔහු සමඟ සිටින බව නිරූපණය කිරීම
5. කටපාඩම් පහසු කිරීම
6. කුරෛෂි ජාතිකයන් සහ වෙනත් අය විසින් නගන ලද ප්‍රශ්නවලට පිළිතුරු සැපයීම
7. දීර්ඝ දිව්‍ය සංවාද මාලාවක්

(ලකුණු 04)

(iii) තර්තීපුත් තිලාවත් තර්දීපුන් නුසුල් යන වෙන්කර දක්වන්න

තර්තීපුත් තිලාවත්	**තර්දීපුන් නුසුල්**
අල්ලාහ් ජිබ්‍රීල් (අලෛ) හරහා පහළ කළ වාක්‍ය	අල්ලාහ් ජිබ්‍රීල් (අලෛ) හරහා පහළ කළ වාක්‍ය
සජ්ඣායනා කරන පිළිවෙළ	එය පහළවූ පිළිවෙළයි
ක්‍රියාත්මක වන මුස්හෆ් අනුපිළිවෙයි	කාල වෙනසට අනුකූලව අල් කුර්ආන් වැකි පහළ වූ අනුපිළිවෙල
මන්සිල් රුකූඅ් සූරා යා අනුපිළිවෙලෙහි දක්නට ලැබෙන දේ	කොටස් වශයෙන් විවිධ ආකාරවලින් දක්නට ලැබේ (අනුපිළිවළ, සූරා, රුකූ නොදැක්වේ)

මෙවැනි සමානකම් සහ වෙනස්කම් ඉස්මතු කිරීම

(ලකුණු 04)

(iv) හදීස් නීති මූලාශ්‍රයක්ය යන්න පෙන්වන අල් කුර්ආන්, අල්-හදීස් මූලයක් බැගින් සඳහන් කරන්න.

- **අල් කුර්ආනය**

1. අතීඋල්ලාහ් වඅතීඋර් රසූල්

2. වමා ආතාකුමුර් රසූලු ...

යනාදී

- **අල් හදීස්**

1. මම කරුණු දෙකක් ලබා දී හැර යමි....

2. මා අනුගමනය කරන තැනැත්තා අල්ලාහ්ගේ අනුගාමිකයෙකි

3. මට කුරානය සහ එවැනි දෙයක් ලබා දී ඇත.

යනාදී

(ලකුණු 04)

Department of Examinations Sri Lanka

(v) ඉස්ලාමීය නීති සම්පාදනයේදී, අල්-කුර්ආන් අනුගමනය කර ඇති පියවරක් නිදසුන් සහිතව පැහැදිලි කරන්න.

- මත්පැන් ක්‍රමක්‍රමයෙන් තහනම් කරීම
- වහලා නිදහස් කරීම
- සමාජ සාධාරණත්වය

මෙවැනි උදාහරණ මගින් පැහැදිලි කිරීම

(ලකුණු 04)

3

I) කිලාෆත් සහ මුල්කියත් යන වාක්‍ය ඛණ්ඩ පැහැදිලි කරන්න.

- කිලාෆත් යනු ජනත පිළිගැනීමක් ඇතිව පාලනය කරීම.
- කිලාෆත් යනු තේරීම, කුසලතා සහ හැකියාව මත පදනම්ව තෝරා ගැනීමේ ක්‍රමයකි
- මුල්කියත් යනු පරම්පරාගත වංශයක් සහිත රාජ වංශයකි.
- රාජකීය උරුමය පමණක් මුල්කොටගත් ක්‍රමයකි

(ලකුණු 04)

II) උමයියාවරුන් පාලනය ලබාගැනීමට හේතු වූ කරුණු දෙකක් සඳහන් කරන්න.

1. හසන් (රලි) තුමාගේ අත්හැරීම
2. උස්මාන් (රලි) ගේ ඝාතය සහ ඝාතකයන් සොයා දඬුවම් දීම ප්‍රමාද කිරීම.
3. සිබ්බීන් සහ නගර්වාන් යුද්ධවලදී අලි (රලි) තුමාගේ පාර්ශවය දුටු අතෘප්තිය.
4. මුආවියා (රලි) දුමතුල් ජන්දල්ගේ තීන්දුව ඔහුට පක්ෂව යොදා ගැනීම.
5. සිරියාවේ දේශයේ ආණ්ඩුකාර ලෙස මුආවියා (රලි) කලීෆා උස්මාන් මගින් පත්කිරීම හා ඊජිප්තුව, සිරියාවේ පරිපාලන කලීෆා අලි (රලි) තුමාගේ කාලයේ තමා යටතේ තියා ගැනීම
6. සිරියාවේ තමා වෙනුවෙන් ආධාරකරුවන් පිරිසක් පිහිටුවා ගැනීම.

(ලකුණු 04)

(iii) කලීෆා වලීද් පාලන සමයේදී සිදුවූ ස්පාඤ්ඤ ජයග්‍රහණය සංක්ෂිප්තව සඳහන් කරන්න.

1. ස්පාඤ්ඤයේ සුදේශ ජනයාගේ කැඳවීම
2. මූසා බින් නුසෙර් සහ තාරික් බින් සියාද් වැනි අයගේ දායකත්වය
3. මුස්ලිම් බලකායට සුදේශ ජනයාගේ සහාය.

මෙවැනි කරුණු ලියවිලා තියෙනවා නම්

(ලකුණු 04)

Department of Examinations - Sri Lanka

(iv) අබ්බාසි සමයේදී නගරය සහ බලකොටුව ඉදිකිරීම ගැන උදාහරණ දෙකක් බැගින් දෙන්න.

බලකොටුව

- කලීෆා මන්සූර් - කස්රුල් හුල්ද්
- කලීෆා ජහ්ෆර් අල් මන්සූර් - කස්රුද් තහබ්
- කලීෆා වසිත් - කස්රුල් හාරෝනි

නගරය

- කලීෆා මන්සූර් - බැග්ඩැඩ් නගරය
- කලීෆා මන්සූර් - රෆීකා, මහ්දියා
- කලීෆා මුහ්තසිම් - සමර්රා

(ලකුණු 04)

V) අබ්බාසි කිලාෆතයේ බලය බිඳීයාමට හේතු වූ කරුණු පැහැදිලි කරන්න.

1. දුර්වල දේශපාලන නායකත්වය
2. කුඩා රාජධානි වල සම්භවය
3. සැලසුම්ගත කුමන්ත්‍රණය
4. තාතාරිවරුන්ගේ ආක්‍රමණය
5. අසම්පූර්ණ ඉඩම් ජය
6. ආගම සම්බන්ධ ගැටළු
7. ගෝත්‍රික ගැටුම

(දේශපාලන, ආගමික, සමාජ-ආර්ථික සාධක මත පදනම්ව හඳුනාගෙන අර්ථකථනය කරීම.)

(ලකුණු 04)

Department of Examinations - Sri Lanka

කොටස - II

4.

I) භූගෝලීය ක්ෂේත්‍රයේ සංවර්ධනයට දායක වූ මුස්ලිම් විද්වතුන් දෙදෙනෙකුගේ ඇගයීම් කරන්න

- අල්කුවාරිස්මි,
- අල්බිරූනි

වැනි භූ විද්‍යාඥයින් .....

- හැඳින්වීම
- සොයාගැනීම්
- පොත්පත්

යනාදි පැහැදිලි කිරීම

(ලකුණු 10)

II) උමයියා සහ අබ්බාසි සමයන්හි මුස්ලිම්වරුන්ගේ භාෂා පරිවර්තන ක්ෂේත්‍රයේ දායකත්වය විස්තර කරන්න.

- දැනුම පර්යේෂණය පිළිබඳ ඉස්ලාමයේ ආභාෂය
- ඉන්දියානු, ග්‍රීක සහ පර්සියානු සිය ගණනකින් සොයාගත් විද්වත් දත්ත ලබා ගැනීමට ඇති උනන්දුව
- ශිෂ්ටාචාරයේ සංකේතයක් ලෙස දැනුම ලබා දීමට ඇති උනන්දුව සහ එයට යොමු වීම.
- උමයා කලීෆා අබ්දුල් මලික් බින් මර්වාන්ගේ පාලන සමයේදී පරිවර්තන කටයුතු ආරම්භ කිරීම.
- අබ්බාසි යුගයේ බයිතුල් හික්මා දැක්වූ දායකත්වය
- පරිවර්තන උත්සාහයේදී අදහස් සමාලෝචනය, නව ඉදිරිපත් කිරීමක් සිදු වේ

මෙවැනි කරුණු ලියා ඇත්නම්

(ලකුණු 10)

5.

(i) ගොතන ලද හදීස් බිහිවීමට හේතු පෙන්වා දෙන්න

(දේශපාලන, ආර්ථික හා ආගමික කරුණු වෙනස්කම් බෙදා පැහැදිලි කිරීම)

- ප්‍රතිපත්ති මුරණ්ඩුකම
- යහපත්කම ප්‍රවර්ධනය කිරීම යන මතය
- සින්ඩිවරුන්ගේ ක්‍රියාව
- භාෂාව, ජාතිය සහ මද්හබ් පිළිබඳ දැඩි ස්ථාවරය
- ආර්ථික වාසි හා තරඟය
- ජනප්‍රියත්වය
- පාලකයාගෙන් තෑගි ලබා ගැනීම

ලෙස ලියා ඇත්නම්

(ලකුණු 10)

Department of Examinations - Sri Lanka

ii) හදීස් කලාවේ වර්ධනයට ඉමාම්වරුන් බුහාරි (රහ්) සහ මුස්ලිම් (රහ්) ගේ දායකත්වය සසඳන්න.

පහත සඳහන් කරුණු සසඳීම

- හැඳින්වීම
- ජාමිඋස් සහීහ් අල් බුහාරි සහ ජාමිඋස් සහීහ් මුස්ලිම්
- හදීස් ගණන
- හදීස් වර්ගීකරණය කිරීමේ ක්‍රමය සමාලෝචනය කිරීම සඳහා කොන්දේසි
- සහීහ් සඳහා පැනවූ කොන්දේසි
- මුත්තඟකුන් අලෙයිහි
- පුරෝකථනය
- අල් කුර්ආනය හැර මීළඟ ප්‍රබල මූලාශ්‍ර ග්‍රන්ථය ලෙස සැලකීම.

(ලකුණු 10)

6.

(i) තෆ්සීර් කලාවේ වර්ධනයට තාබිඊන් සමයේ භූමිකාව පැහැදිලි කරන්න.

- නබි සල්ලල්ලාහු අලෙයිහි වසල්ලම් තුමාණන්ගේ සහාබාවරුන් මෙන්, තාබියීන් ද අල්-කුර්ආනය අර්ථ අවබොධ කිරීම සහ අර්ථ නිරූපණය කිරීම කෙරෙහි අවධානය යොමු කළහ.
- තාබිඊන්වරුන් අල් කුර්ආන් සහ අල්-හදීස් වාක්‍යවල අවබොධය නොමැති කරුණු සම්බන්ධයෙන් සහාබාවරුන් සොයා ගොස් ඇති අතර, කුර්ආනය ඉජ්තිහාද් ආධාරයෙන් අර්ථකථනය කර ඇත.
- අධිරාජ්‍යයේ ව්‍යාප්තියත් සමඟ ඔවුහු තම උපන් ස්ථාන හැර ගියහ. මක්කම, මදීනා සහ ඉරාකයේ ඇති තෆ්සීර් පන්ති ඉගෙනීමෙන් ඔවුහු තම දැනුම පුළුල් කළහ.
- තෆ්සීර් බින් මාඉූර් සහ තෆ්සීර් බිල් මඉූල් යන දෙවර්ගයම පදනම් කර ගනිමින් තබියීන්ගේ තෆ්සීර් සංවර්ධනය වී ඇත.
- මක්කා තෆ්සීර් පංතියේ සර්ද් බින් ජුබෛර්, මුජාහිද්, ඉක්රිමා යන අය ද මදීනා පංතියේ දී සෛද් බින් අස්ලම්, අබුල් ආලියා යන අය ද ඉරාක් පංතියේ දී හසනුල් බසරි, අල්කමා යන අය ද ප්‍රසිද්ධ තබවුත් තාබිඊන්වරුන් ය.
- පසුකාලීනව තෆ්සීර් කලාවේ ප්‍රසිද්ධියට පත් වූ ඉමාම් තබරි, ඉමාම් සුයුති සහ ඉබ්නු කසීර් වැනි තෆ්සීර්වල තාබිඊන්ගේ අදහස් බොහෝ සෙයින් අවශෝෂණය කර ඇත.
- අකීඩාවේ ගැටුම්, ඊශ්‍රායීලිය්‍යා බලපෑම තාබියීන්ගේ තෆ්සීර් හි නිරීක්ෂණය කෙරේ.

(ලකුණු 10)

(ii) මුතසිලාවරුන්ගේ ප්‍රධාන සංකල්ප පහම පැහැදිලි කරන්න.

1. අත්තව්හීඩ්
2. අල් අද්ල්
3. අල්මන්සිලතු බෛනල් මන්සිලතෛන්
4. අල් වඉදු වල් වඊද්
5. අල් අම්රු බිල් මඉරූෆි වන්නහ්ඉ අනිල් මුන්කර්

යන කරුණු විස්තරව පැහැදිලි කළ යුතුය.

(ලකුණු 10)

Department of Examinations - Sri Lanka

7

1. මුස්ලිම්වරයෙකු තම මැවුම්කරුවා සමඟ සම්දතා ඇති කරගැනීමේ ඇති ප්‍රයෝජන පැහැදිලි කරන්න

- අධ්‍යාත්මික සංවර්ධනය
- විශ්වාසය
- ඉවසීම
- ධෛර්යය සහ නිර්භීතකම වර්ධනය කරන්න
- මානසික සැනසීම සහ තෘප්තිය
- කලකිරීම, මානසික අවපීඩනය සහ ආතතිය දුරු කරන්න
- යහපත පිළිබඳ කුතුහලය
- නපුරට වෛර කිරීම
- ජනතා සමගිය - අන්‍යෝන්‍ය ආධාර
- යුක්තියේ අඛණ්ඩතාව වැඩි දියුණු කිරීම

මෙවැනි කාරණා ලියා ඇත්නම්

(ලකුණු 10)

II) අනෙකුත් සමාජයන් සමඟ එක්ව ජීවත්වීම සම්බන්ධ ඉස්ලාමීය ඉගැන්වීම් පැහැදිලි කරන්න.

(අනෙකුත් ප්‍රජාවන් සමඟ සහජීවනය සඳහා ඉස්ලාමයේ මාර්ගෝපදේශ. අල්-කුර්ආනය සහ අල්-හදීස් ඉගැන්වීම්වල කේන්ද්‍රීය වේ.)

- මිනිසුන් අල්ලාහ් විසින් එක් ආත්මයකින් මවා ඇත.
- මිනිසුන්ට විශේෂ ගෞරවයක් ඇත.
- සෑම කෙනෙකුටම නිදහස සහ තේරීම ඇත.
- මානව සමාජයට අන්‍යෝන්‍ය ප්‍රතිලාභ ලගා කරවීම සෑම මිනිසෙකුගේම යුතුකමකි.
- මානව සහෝදරත්වය ඉස්ලාමයේ මූලධර්මවලට කේන්ද්‍රීය වේ.
- භාෂාව, සංස්කෘතිය, ක්‍රියාකාරකම්, ඉතිහාසය යනාදී වෙනස්කම් දේවධර්මීය හා ස්වභාවික ය. මෙම විවිධත්වය මිනිසුන්ව හඳුනා ගැනීම සඳහාය.
- භේදයකින් තොරව සියලුම මිනිසුන් සඳහා ඉස්ලාමයේ පදනම වන්නේ මානුෂීය ආධාරය.
- යුක්තිය හා නීතිය ඉදිරියේ සියලු මනුෂ්‍යයන් සමානය.
- කෙසේ වෙතත්, මුස්ලිම්වරුන්ට ඔවුන්ගේ අනෙන්‍යථාවය නැති නොවන පරිදි අනෙකුත් ප්‍රජාවන් සමඟ සුහදව සිටීම අවශ්‍ය වේ.
- සහජීවනය - ඉස්ලාමීය ඉතිහාසයේ සිදුවීම් හා උදාහරණ දැක්වීම.

මෙවැනි කරුණු ලියා ඇත්නම්

(ලකුණු 10)

Department of Examinations - Sri Lanka

8

(i) ක්‍ර.ව. 7 වන සහ 8 වන ශත වර්ෂවල ශ්‍රී ලංකාවේ ඉස්ලාම් හඳුන්වාදීම පිළිබඳව සාධක සහිතව පැහැදිලි කරන්න.

ක්‍ර.ව. 7 වන සහ 8 වන ශත වර්ෂවල මුල් භාගයේදී ඉස්ලාම් ශ්‍රී ලංකාවේ හඳුන්වා දී ඇති බවට සාධක ඇත.

- ශ්‍රී ලංකාවේ පිහිටීම සහ සේද මාවතේ ශ්‍රී ලංකාවේ වැදගත්කම
- සමුද්‍රීය වෙළඳ මාර්ගයේ වෙළඳුන් සම්බන්ධ කර ගැනීමට ශ්‍රී ලංකාවට විවිධ ආකාරවලින් සහාය වීම
- අරාබි ජාතිකයන් ඇතුළු ලෝක වැසියන් වෙළෙඳ හා සංචාරක කටයුතු සඳහා ශ්‍රී ලංකාවට පැමිණීම
- නබිවරුන්ගේ දූතයා වන වහබ් ඉබ්න් අබු කබ්ෂා ලංකාවට පැමිණ ලංකාවේ රජුට ඉස්ලාම් ආගම පිළිබඳව ආරාධනා කළේය.
- පුරාවස්තු අධ්‍යයනය සහ අරාබි නටබුන් පෙන්වන සාක්ෂි
- ශ්‍රී ලංකා රජකු විසින් දූතයක් යවීම ගැන අජායිපුල් හින්දු නමැති පොතේ ඉප්නු සහ්රයාර් ලබාදෙන තොරතුරු
- උමයියා පාලන සමයේදී හජ්ජාජ් ඉබ්න් යූසුෆ්ගෙ හිංසා පීඩාවලට බියෙන් සමහර හෂිම්වරු ශ්‍රී ලංකාවේ සරණ ගියහ - Allexander Johnston
- ක්‍ර.ව. 8 වැනි සියවසේ ශ්‍රී ලංකාව පාලනය කළ රජු ශ්‍රී ලංකාවෙන් වැන්දඹුවන් කිහිප දෙනෙකු ධමස්කස් වෙත යැවූ බව ෆුතූහුල් බුල්දාන් හි සඳහන් වීම. (සිංදු (ඉන්දියාව) ජහග්‍රහණයට මෙම සිදුවීම බලපා ඇත)
  මෙම කරුණු ඉදිරිපත් කිරීම

(ලකුණු 10)

(ii) මහනුවර ඇල්කෙමියේදී මුස්ලිම්වරුන් විසින් ඉටු කරන ලද සේවාවන් ලැයිස්තුගත කර ඒවායින් දෙකක් ගැන පැහැදිලි කරන්න.

- දේශපාලන දායකත්වය
- ආර්ථික දායකත්වය
- ආරක්ෂක දායකත්වය
- වෛද්‍ය දායකත්වය
- ප්‍රවාහනය සහ ධීවර කටයුතු
- රජ මාලිගා පරිපාලනය

ඉහතින් දැක්වෙන පරිදි, සිසුන් තමන් කැමති ක්ෂේත්‍ර දෙක සඳහා **මුස්ලිම්වරුන්ගේ දායකත්වය** සහ මුස්ලිම්වරුන්ට ඔවුන් ලැබූ **තනතුරු සහ ඉඩම් තෑගි** ප්‍රදර්ශන කළ යුතුය

(ලකුණු 10)

****

Department of Examinations - Sri Lanka